**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2017**

---------------------------------------------------------------------------------------------

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මේ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් 2018 අප්‍රේල් 11 දින මණ්ඩලයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

--------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් ප්‍රකාශනයේ, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

--------------------

**2.1 මතය ව්‍යාවනය**

-----------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

---

2016 හා 2017 වර්ෂ වලදී ගොවි දායකත්ව ආදායම පිළිවෙලින් රු. 35,198,320 ක් හා රු. 29,381,645 ක් වූ අතර විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිවෙලින් රු. 2,611,078,145 ක් හා රු. 2,616,581,105 ක් වී තිබුණි. ගොවි දායකත්වයට එරෙහිව විශ්‍රාම වැටුප් ගෙවීම් ඉහළ යාම නිසා 2016 හා 2017 වර්ෂ වලදී පිළිවෙලින් රු. 2,450,000,000 ක් හා රු. 2,520,000,000 ක් භාණ්ඩාගාරය මඟින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වැය කර තිබුණි. ඒ අනුව භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතී.

එසේම සමාලෝචිත වර්ෂය අවසානයට යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් වගකීම රු.63,220,697,989 ක් වූ අතර එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 6.1 ක වැඩි වීමකි. එසේම යෝජනා ක්‍රමයේ ශුද්ධ වත්කම් රු.67,771,138,975 ක සෘණ අගයක් වී තිබුණි. ඒ සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 අනුව ආයුගණක තක්සේරුව, 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම හා පැරණි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය අනුව දායක මුදල් අයකිරීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ඒ අනුව මෙම අහිතකර මූල්‍ය තත්ත්වය ඉදිරියේදී තවදුරටත් වර්ධනය විය හැකි බැවින්ද මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බවට ආයතනය විසින් තහවුරු කර නොමැති බැවින්ද යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

### 2.2.2 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

---

මණ්ඩලය යටතේ පවතින කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයට සමූහ ජීවිත රක්ෂණ වෙනුවෙන් ගෙවිය යුතු රු.194,619,125 ක වටිනාකම පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු ගිණුම් සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

---

ප්‍රමිතයේ 79 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.2,102,060 ක්වූ මෝටර් රථ සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද ඒවා තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි.ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

---

(i). ප්‍රමිතයේ 59 වන ඡේදය ප්‍රකාරව සක්‍රීය දායකයන් හා ගොවි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් සඳහාම සමාලෝචනය කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව එය සිදුකර නොතිබුණි. ඒ අනුව විශ්‍රාම වැටුප් වගකීම සඳහා වෙන්කිරීමේ දී ඒ සඳහා සැලකිය යුතු බලපෑමක් කළ හැකි පොළී අනුපාතය, බඳවා ගැනීම්, ඉවත්වීම්, මරණ, අබලතාවයන් වැනි මූලික සංරචකයන් සහ සක්‍රිය දායකයන්ගේ සහ ගොවි විශ්‍රාමිකයන්ගේ වෙනස්වීම් කෙරෙහි සැලකිල්ලක් දක්වා නොතිබීම හේතුවෙන් 2007 වර්ෂයේදී රු.29,473,158,000 ක් වූ ප්‍රතිපාදනය 2017 වර්ෂයේදී රු.63,220.697,989 ක් දක්වා එනම් සියයට 115 කින් වැඩිවී තිබුණි.

(ii). 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනත අනුව වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු වුවද ඊට පටහැනිව විශ්‍රාම වැටුප සකස් කළ දින සිට ගෙවීම් සිදු කර තිබුණි. 2017 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලය තුල ගොවීන් 9,927 දෙනෙකු විශ්‍රාම වැටුප් ඉල්ලුම් කර තිබුණු අතර ඔවුන් වෙනුවෙන් නොගෙවූ හිඟ මුදල් එකතුව රු.244,034,838 ක් වී තිබුණි. එසේ වුවද ප්‍රමිතයේ 14 වන ඡේදය ප්‍රකාරව ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන වල කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි.

**2.2.4 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

---------------------------

ප්‍රාග්ධන ප්‍රදාන වත්කමේ ඵලදායී ජීවිත කාලය තුල ක්‍රමානුකූල පදනමකින් ආදායමට බැරකිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වුවද 1989 වර්ෂයට පෙර එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් ලැබී තිබුණු රු.547,885 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.3,295,285 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු තුල ඇතුළත් 1997 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අයත් විගණන ගාස්තු සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයන්හි ජංගම වගකීම් යටතේ දක්වා ඇති රු.3,257,634,369 ක ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ශේෂය තුළ 2012 සහ 2013 වර්ෂ වෙනුවෙන් ගොවීන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් එකතුව රු.3,033,329,200 ක් ඇතුළත්ව තිබුණු අතර එම වටිනාකම නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් හා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයෙන් 2010 හා 2011 වර්ෂවල දී පිළිවෙලින් රු.518,000,000 හා රු.295,230,441 ක ණය මුදලක් ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ අනුව එම ණය සඳහා පොළියද ඇතුළත්ව ජංගම වගකීම් යටතේ පිළිවෙලින් රු. 663,905,406 ක් හා රු.398,274,007 ක් ලෙස දක්වා තිබුණි. එසේ වුවද එම ණය වෙනුවෙන් අයකරන පොළී ප්‍රතිශතය, ආපසු ගෙවිය යුතු කාලය, ණය මුදල ආවරණය වන වාරික ගණන , වාරිකයක වටිනාකම ආදී කොන්දේසි ඇතුළත් කර ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත. | |
| (අ) 15 (2),(3) වගන්ති | පනතේ විධිවිධාන ප්‍රකාරව වාරික ගෙවීම් පැහැර හරින සාමාජිකයන්ගේ සාමාජිකත්වය අහෝසි කිරීම සම්බන්ධයෙන් අදාල සාමාජිකයාට දැනුම් දීමට කටයුතු කර නොතිබුණු අතර ඒ හේතුවෙන් අවලංගු වූ සහතිකයක් නැවත වලංගු කරවා ගැනීමට දායකයෙකුට ඇති අයිතිය ද උල්ලංඝණය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී වාරික ගෙවීම් පැහැර හරින ලද සාමාජිකයන් 3024 ක් වෙනුවෙන් ශුද්ධ වාරික වශයෙන් රු.18,839,792 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. |
| (ආ) 20 වගන්තිය | උපදේශක කමිටුව සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සංයුක්ත විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී සාමාජිකයන් 10 දෙනෙකු පමණක් පත්කර තිබූ අතර එක් රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි . |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 42,640,061 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 74,030,438 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.31,390,377 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ආදායම රු.13,159,670 කින් අඩු වී වියදම රු.26,471,566 කින් වැඩි වී තිබුණ ද රජයෙන් ලබා දෙන ලද ප්‍රදානය රු.70,000,000 කින් වැඩි වීම මෙම ඌනතාවයේ අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ ඌනතාවය 2014 වර්ෂයේදී අතිරික්තයක් බවට පත්ව නැවත 2015 වර්ෂයේ සිට මූල්‍ය ඌනතාවයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදි රු. 1,678,119,540ක් වූ ඍණ දායකත්වය 2014 සිට 2017 වර්ෂය දක්වා පිළිවෙලින් රු. 74,364,024 ක් රු (159,604,332 ) රු. 20,328,449 ක් හා රු. 54,958,066 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි වර්ෂය තුළ දී ගොවීන් 700 ක් බඳවා ගැනීම හා ඔවුන්ගෙන් රු.1,106,400 ක දායක මුදල් ලබාගැනීමට සැලසුම් කර තිබුණ නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

ආයතනයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනතේ 4 වන වගන්තිය අනුව නියමිත සුදුසුකම් දරන්නාවූ ද වයස අවූ 18 ට නොඅඩු සහ වයස අවුරුදු 59 නොවැඩි යම් ගොවියෙකු මෙම යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම ඇති බව දක්වා ඇතත්, 2012 වර්ෂය අවසන් වනවිට යෝජනා ක්‍රමයේ සක්‍රීය ගොවීන් සංඛ්‍යාව 959,254 ක් වූ අතර, ඉන් පසුව කිසිදු සාමාජිකයෙකු යෝජනා ක්‍රමයට බඳවාගෙන සාමාජිකත්වය වර්ධනය කර ගැනීමට ප්‍රමාණවත් හා විධිමත් වූ ක්‍රමවේදයක් අනුගමනය කිරීමට ආයතනය කටයුතු කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දී ඉල්ලා අස්වීම්, මරණ, බෙලහීන හා වාරික නොගෙවීම මත යෝජනා ක්‍රමයෙන් ගොවීන් 3,025 ක් අඩු වී තිබුණ ද 2012 වර්ෂයෙන් පසු තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන නොයාම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සක්‍රීය සාමාජික සංඛ්‍යාව කොපමණද යන්න තහවුරු කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ආ) 2012 වර්ෂයෙන් පසු සාමාජිකයින්ගේ වාරික මුදල් අයකිරීම්, සාමාජිකත්වය අහෝසි කිරීම්, ප්‍රතිලාභ ලබා දීම් හා ගොවියන්ගේ පෞද්ගලික තොරතුරු ආදිය පරිගණක පද්ධතියේ නිසි පරිදි යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් යෝජනා ක්‍රමයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා තොරතුරු ලබා ගැනීමට හැකියාවක් නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව 2014 ජනවාරි 01 දින සිට නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැරණි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අනුව දායක මුදල් අයකර විශ්‍රාම වැටුප් ගෙවීම් නව යෝජනා ක්‍රමය අනුව සිදුකරමින් පැවතුණි. මෙම තත්ත්වය මත 2014 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රු.7,664,298,940 ක විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර තිබූ අතර රු.92,443,207 ක් පමණක් දායකත්වය වශයෙන් අය වී තිබුණි.මෙම යෝජනාක්‍රමයේ ඉදිරි පැවැත්ම උදෙසා නව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට හෝ සංශෝධනය කර එය ක්‍රියාවට නැංවීමට 2018 මැයි 30 දින වන විටත් කළමණාකරණය අපොහොසත් වී තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායකත්වය ලබාගැනීමේ හා ප්‍රතිලාභ ලබාගැනීමේ වයස පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ආයතනය විසින් පවත්වා ගෙන ගොස් නොතිබීම හේතුවෙන් වයස අවුරුදු 61 ත් 68 ත් අතර කාලය තුල අයදුම්කරුවන් 10 දෙනෙකු දායකත්ව අයදුම්පත් ඉදිරිපත් කර තිබුණු බව කලුතර දිස්ත්‍රික් කාර්යාල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) විශ්‍රාම වැටුප් ගෙවීම් අයදුම්පත් 50 ක නියැදියක් පරීක්ෂාවේදී ඉන් අයදුම්පත් 08 ක් ඒවා ඉදිරිපත් කල දින සිට ගෙවීම් සිදු කිරීම සඳහා මාස 07 සිට වර්ෂ 02 කට වැඩි කාලයක් ගත කල අවස්ථා පැවති බව නිරීක්ෂණය විය.

(ඈ) යෝජනා ක්‍රමය සඳහා දායකත්වය ලත් දායකයින්වෙත පිරිනමනු ලබන ඔප්පුව අනුව දායකයා වයස අවුරුදු 80 ට පෙර මියගියහොත් ඔහුගේ අසූවෙනි උපන් දිනය යෙදෙන මාසය දක්වා කලත්‍රයාට විශ්‍රාම වැටුප් හිමිවන බව දක්වා තිබුණද 2014 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් දක්වා කලත්‍රයා හිමිකම් ඉල්ලුම් කල අයදුම්පත් කොපමණ ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලය වෙත ලැබී තිබේද යන්න පිළිබඳ සංඛ්‍යාමය දත්තයන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් කාර්යාල වලින් විශ්‍රාම වැටුප් අංශයට විශ්‍රාම වැටුප් ඉල්ලුම්පත් 6,680 ක් ලැබී තිබූ අතර ඉන් 4,917 කට පමණක් විසඳුම් ලබා දී තිබුණි. නුවර හා මාතලේ දිස්ත්‍රික්කයන්හි විශ්‍රාම වැටුප් ඉල්ලීම් 584 ක් සඳහා කිසිදු තීරණයක් ලබා දී නොතිබුණි.

(ඊ) හිමිකම් නොපාන ලද විශ්‍රාම වැටුප් ඊට පසුව එළඹෙන මාසයේ පළමුවන දින මණ්ඩලය වෙත නැවත එවිය යුතු වුවද, කළමනාකරණය විසින් ඒ පිළිබඳ පසු විපරම් කටයුතු සිදුනොකිරීම හේතුවෙන් නොගෙවන ලද විශ්‍රාම වැටුප් එකතුව රු.10,997,732 ක් මාස 03 කට වැඩි කාලයක් නිශ්කාර්යව බාහිර තැපැල් කාර්යාලවල රඳවා පැවති බව නිරීක්ෂණය විය.

(උ) බැංකු ගිණුම් 03 කට අදාලව 1992 වර්ෂයේ සිට පැවත එන තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.1,179,624 ක් වටිනා චෙක්පත් 117 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**
**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2015 ජනවාරි 28 දිනැති ලිපිය අනුව 2014 ජනවාරි සිට ක්‍රියාත්මක වූ නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකයන්ගේ ජීව දත්ත පිළිබඳ සමීක්ෂණ කටයුතු දිස්ත්‍රික් කාර්යාල විසින් 2015 පෙබරවාරි 28 දිනට පෙර සම්පූර්ණ කළ යුතු වුවද, දිස්ත්‍රික් කාර්යාල 25 න් 14 ක සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. පරිගණක පද්ධතිය සකස් කිරීමට ආසන්න වශයෙන් රු.2,705,000 ක් ද සමීක්ෂණය සඳහා සහභාගී වූ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් වෙත දිරිදීමනා හා වෙනත් වියදම් ලෙස රු.1,726,875 ක මුදලක් වැය කර තිබුණ ද සමීක්ෂණය සම්පූර්ණ කර නොතිබීම හා ලැබෙන තොරතුරු මත පදනම්ව පද්ධතිය යාවත්කාලීන කර නොතිබීම නිසා ඒ වෙනුවෙන් දරන ලද වියදම නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් නොපාන අවස්ථාවලදී එසේ හිමිකම් නොපෑමට හේතු සොයා බැලීමකින් තොරව මාස 07 සිට 11 දක්වා වාර ප්‍රමාණයක් දිසා ගිණුම් කාර්යාල වෙත නැවත නැවත යවා තිබුණි. හිමිකම් නොපාන ලද විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් වෙත වාර තුනකට වඩා වැඩි වාර ගණන් ගෙවීම් චෙක්පත් යැවීමට සිදුවීමේදී එයට හේතු සොයා කටයුතු කිරීමට දිස්ත්‍රික් කාර්යාල හෝ මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2015 වර්ෂයේ මාතර දිස්ත්‍රික්ක ගොවි විශ්‍රාම වැටුප් සමීක්ෂණයට සම්බන්ධ වූ ගොවිජන මධ්‍යස්ථාන 22 ක කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ට ගෙවීමට නියමිත රු.120,850 ක දිරිදීමනා එම නිලධාරීන්ට නොගෙවා අනුමැතියකින් තොරව මාතර දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් මාතර දිස්ත්‍රික් සහකාර කොමසාරිස්ට රු. 15,000 ක්ද ගොවිජන සේවා මධ්‍යස්ථාන සංවර්ධන නිලධාරීන් 22 දෙදෙනකු සඳහා රු. 4000 බැගින් රු. 88,000 ක්ද වශයෙන් ගෙවා තිබුණි. ඉතිරිව පැවති රු.17,850 ක මුදල 2017 ඔක්තෝබර් 25 වන විගණන දින වන විටද දිස්ත්‍රික් කාර්යාලයට පියවා නොතිබුණි. එමෙන්ම රු.17,850 ක් 2015 දෙසැම්බර් 21 දින කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ට ගෙවීම සඳහා දිස්ත්‍රික් කාර්යාලයෙන් ලබාගෙන තිබුණ ද එය නිලධාරීන්ට ගෙවූ බවට කිසිදු තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 5. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් වීම මත ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය විසින් සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු අරමුණු වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු වන දරිද්‍රතාවය එහි සෑම ආකාරයකින්ම සෑම තැනකින්ම අවසන් කිරීම සඳහා ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන තිබුණ ද, එහි විෂය පථයට ගැනෙන 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරණ ගැසට් පත්‍රය මඟින් නව යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාවට නැංවීම සඳහා කර තිබූ සංශෝධනයන් සම්පූර්ණයෙන්ම ක්‍රියාවට නැංවීම ආයතනය කටයුතු කර නොතිබුණි. එසේ හෙයින් යෝජනා ක්‍රමයේ සංශෝධන මඟින් ලබා කර ගැනීමට අපේක්ෂා කරන ලද ඉලක්ක ඉටු කර ගැනීමට හැකි වී නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යෝජනා ක්‍රමයේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, සමාජ සවිබල ගැන්වීමේ හා සුබසාධන අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය, ගොවි සංවිධාන හා ගොවීන් යනාදී පාර්ශවයන් හඳුනාගත හැකි වුවද නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයක් සැකසීමට 2016 සැප්තැම්බර් 13 දින ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා "නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ඇති කිරීමට මූල්‍යමය වශයෙන් ස්ථාවර හා තිරසර යෝජනාවක් ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස " 2016 ඔක්තෝබර් 26 දින අමාත්‍ය මණ්ඩල තීරණයෙන් යෝජනා කර තිබුණ ද 2018 ජුනි විගණන අවස්ථාව වන විටත් ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) නිවැරදි කාර්යසාධනයක් මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සඳහා සාමාජිකයන්ගේ ජීව දත්ත පිළිබඳ සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සමීක්ෂණයක් කර නොතිබීම, 2015 වර්ෂයේ කරන ලද සමීක්ෂණ කටයුතු නිසි ලෙස කළමනාකරණය නොකිරීම, 2007 වර්ෂයෙන් පසු සක්‍රිය ගොවි දායකයින් පිළිබඳ ආයුගණක තක්සේරුවක් කර යන කරුණු හේතු වී ඇති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට සූදානම් වීමේදී මණ්ඩලය සමඟ බැඳී පවතින අනෙකුත් ආයතන වන දිසා ගිණුම් කාර්යාල, ගොවිජන සේවා මධ්‍යස්ථාන, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාමීය බැංකු සමඟ මනා සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ලඟා වීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------

### 6.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 18 සිට සියයට 81 අතර විචලනයන් වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 6.2 සමාජ වගකීම ඉටුකිරීම

--------------------------

ශ්‍රී ලංකාවේ ගොවිතැන් කටයුතු වල නිරතවන ගොවි ජනතාව වයස්ගත වූ විට හෝ බෙලහීනතාවයට පත් වූ විට හෝ අකල් මරණයකට පත් වූ විටක මුහුණ පෑමට සිදුවන සමාජ සහ ආර්ථික ගැටළු වලදී යම් සහනයක් ලබාදීමට මෙම යෝජනා ක්‍රමය හඳුන්වා දී තිබුණි. මෙම යෝජනා ක්‍රමයට බැඳුනු ගොවීන්ට ආයතනයෙන් ලබාදිය යුතු සේවාව කාර්යක්ෂමව, ඵලදායිව හා අපේක්ෂා කළ පරිදි ඉටුනොවීමේ තත්වයක් පවතින බව පහත කරුණු අනුව අනාවරණය විය.

(අ) ගොවි විශ්‍රාම වැටුප් අංශයට දිස්ත්‍රික් කාර්යාල 29 න් ලද ශුද්ධ වාරික අයදුම්පත්‍ර වලින් 2016 වර්ෂයේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත් 466 කට හා 2017 වර්ෂයේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත් 217 කට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෙවීම් කර නොතිබුණි. එසේම පරීක්ෂා කළ නියැදියට අනුව (2017 අගෝස්තු හා දෙසැම්බර්) දිස්ත්‍රික් කාර්යාල වලින් ලද ශුද්ධ වාරික ගෙවීම් ගණනය කිරීම සඳහා වර්ෂ 2 ½ ත් 5 ½ ත් අතර වූ කාල පරාසයක ප්‍රමාදයන් සිදු වී තිබුණි.

(ආ) 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 13(2) (ආ) ඡේදය පරිදි දායකයාට ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුපෙන් එක් එක් මාසයේදී රු. 50 ක මුදලක් අඩුකර තිබුණ ද මෙම මුදලින් ගනු ලබන ක්‍රියාමාර්ග ගැසට්පත්‍රය මගින් අනාවරණය කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) මූල්‍ය පාලනය | හිමිකම් නොපාන ලද විශ්‍රාම වැටුප් ප්‍රමාදයකින් තොරව ආපසු ගෙන්වා නොගැනීම. |
| (ආ) දායක මුදල් රැස්කිරීම, ගෙවීම හා ගිණුම්ගත කිරීම | (i). දායක වාරික ගෙවීම් පැහැර හරින සාමාජිකයන් දැනුවත් කර සාමාජිකත්වය අහෝසි වීම වැළැක්වීමට කටයුතු නොකිරීම. |
| | (ii). පරිගණක පද්ධතිය නිසි පරිදි යාවත්කාලීන කර යෝජනා ක්‍රමයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා තොරතුරු ලබා ගැනීමට කටයුතු නොකිරීම. |
| | (iii). ශුද්ධ වාරික ගෙවීම් ඉල්ලුම්පත් සැකසීම කාල ප්‍රමාදයකින් තොරව සිදු නොකිරීම. |